# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2287/24 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/2017

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත**

1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත් ලබාදීමේ පනතේ 3 වන වගන්තියේ (5) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 10 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍ය.

2022 ජුනි මස 25 වැනි දින
කොළඹ දී ය.

නියෝග

1993 අප්‍රේල් මස 21 වැනි දින අංක 763/8 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියෝග මගින් සංශෝධිත පරිදි වූ, 1991 ඔක්තෝබර් මස 17 වැනි දින අංක 684/9 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1991 නැව් නියෝජිතයන්ට (බලපත්

1A - G 037247 — 8 (2022/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දීමේ) නියෝගවල 5 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ) (ii) වන අනුඡේදයේ, "බලපත්‍රයක් ලැබීම සඳහා සුදුසු නොවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.-

"බලපත්‍රයක් ලැබීම සඳහා සුදුසු නොවිය යුතු යඃ

එසේ වුව ද,

(අ) කොටස්වල හිමිකාරීත්වය විදේශීය රටක පුරවැසියකු විසින් හෝ විදේශීය රටක සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ රජයේ හෝ පෞද්ගලික සමාගමක් විසින් දරනු ලබන; සහ

(ආ) එම විදේශීය රටෙහි නීතිය මගින්, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට, එම රටෙහි සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ රජයේ හෝ පෞද්ගලික සමාගමක කොටස් හිමිකාරීත්වය දැරීම තහනම් කරනු ලබන අවස්ථාවක දී,

මෙම අනුඡේදය යටතේ, කිසිදු රජයේ හෝ පෞද්ගලික සමාගමක් බලපත්‍රයක් ලැබීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු යඃ

එසේ වුව ද, ජාතික අභිවෘද්ධිය සහ ව්‍යතිරේක කරුණු සලකා බැලීමේ දී, අමාත්‍යවරයා විසින් මෙම අවශ්‍යතාව අත්හරිනු ලැබිය හැකි ය.".

EOG 08 - 0135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.